**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය 2018**

**CMS 2113 - ගුවන්විදුලි මාධ්‍ය : න්‍යාය හා භාවිතය**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න** **කාලය පැය දෙකයි**

---

01. 'ග්‍රාහකයාට වඩාත් සමීප වීම සඳහා ගුවන්විදුලි මාධ්‍යයේ නව ප්‍රවණතා උපස්තම්භක වී තිබේ.' යෝග්‍ය උදාහරණ දක්වමින් විවරණය කරන්න.

*(ලකුණු 20)*

02. ගුවන්විදුලි මාධ්‍යය සතු ශක්‍යතා එකී මාධ්‍යයේ පරිපූර්ණත්වය කෙරෙහි බලපා ඇති ආකාරය නිදර්ශන සහිත ව පෙන්වා දෙන්න.

*(ලකුණු 20)*

03. ගුවන්විදුලි නාලිකාවල පැවැත්ම උදෙසා ශ්‍රවණ පර්යේෂණ කාර්යයෙහි උපයෝගිතාව හා ඵලදායිතාව ඔබේ අත්දැකීම් හා ආනුභවික නිරීක්ෂණ ඇසුරින් විස්තර කරන්න.

*(ලකුණු 20)*

04. ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තියට අදාළ ව එහි සමාරම්භයේ සිට දශක පහක කාලය තුළ විද්‍යමාන වන ප්‍රවණතා හා වර්ධනීය අවස්ථා අලළා විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

*(ලකුණු 20)*

*අනෙක් පිටුවට*

05. කිසියම් ප්‍රජාවක පොදු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රජා ගුවන්විදුලිය දායක වන ආකාරය එහි ලක්ෂණ හා කාර්යභාරය කෙරෙහි සාවධාන ව විමර්ශනය කරන්න.

*(ලකුණු 20)*

**නැතහොත්**

'ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවල භූමිකාව, කාර්යභාරය හා පැවැත්ම අභියෝගයට ලක් ව තිබේ.' වර්තමාන ශ්‍රී ලාංකේය ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා කෙරෙහි සාවධාන ව විචාරාත්මක සටහනක් සම්පාදනය කරන්න.

*(ලකුණු 20)*

06. ගුවන්විදුලි සන්නිවේදකයාගේ කාර්යභාරය සාර්ථක කරගැනීමේදී නිරවද්‍ය හා නිර්මාණාත්මක භාෂා භාවිතය වැදගත් වන ආකාරය නිදර්ශන සහිත ව විස්තර කරන්න.

*(ලකුණු 20)*

07. 'අධ්‍යාපන ප්‍රවර්ධන කාරකයක් ලෙස ගුවන්විදුලියේ කාර්යභාරය වර්තමානයේදී වඩාත් පුළුල් වී ඇත.' දේශීය හා ගෝලීය නිදර්ශන ඇසුරින් පහදන්න.

*(ලකුණු 20)*